**දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල - 2015**

**------------------------------------------------------------**

දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මං විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිති අංක 02 ක ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2015 දෙසැම්බර් 31 දිනට තොග පොතේ ශේෂයට වඩා වැඩියෙන් පැවති රු. 780,879 ක තොග මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් වශයෙන්ද, 2014 වර්ෂයේ තොග හානි රු.737,567 ක් සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් කපාහැරීම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් වශයෙන්ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබිය යුතු මුදල් යටතේ මුදල් ගලායාම රු. 8,380,417 ක් වුවද, එය රු. 7,616,783 ක් වශයෙන් දක්වා තිබුණි.

(ආ) ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කමට සමාන අගයකින් ක්ෂය වෙන් කර තිබෙන විට එම වත්කමේ ධාරණ අගය නිශ්චය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. එසේ වුවද, සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ ගත් මිල රු.119,962 ක් වූ කාර්යාලීය උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්තු වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට එම ගබඩාවල පැවති රු. 12,725,122 ක ඉතිරි තොගයට අදාළ නොයිපයූ ලාභය රු. 1,156,829 ක් විය යුතු වුවද , බැංකු සංගම්වලට අලෙවි කළ ලිපිද්‍රව්‍යද ඇතුළත්ව දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබිය යුතු රු. 34,057,486 ක මුළු මුදල සඳහාම නොයිපයූ ලාභය රු. 3,096,135 ක් වශයෙන් ගණනය කිරීම හේතුවෙන් එය රු.1,939,306 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ඉකුත් වර්ෂයේදීද මෙම ප්‍රතිපත්තියම ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වර්ෂය ආරම්භයේ නොඉපයූ ලාභයද රු. 939,425 ක් වැඩියෙන් ගලපා තිබුණි. එම හේතුවෙන් ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ලාභය රු. 999,881 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු. 80,500 ක අගරු චෙක්පතක් ගිණුම්ගත කිරීමේදී පෙර වර්ෂයේ සිදු වූ වරද නිවැරදි කිරීමේදී නිවැරදි ගිණුම්වලට ඇතුළත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 71,404 ක් හා ජංගම වගකීම් රු. 1,778 ක් වැඩියෙන්ද, ජංගම වත්කම් රු. 80,500 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට තොග පොත් අනුව ශේෂය රු. 25,548,198 ක් වුවත් භෞතික තොග සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු. 26,089,772ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් වෙනස වූ රු. 541,573ක් නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව ලාභයක් ලෙස ගලපා තිබුණි. එසේ වුවද, රු. 1,067,714 ක් වටිනා තොග, තොග පොතට ඇතුළත් නොවීම, තොග වටිනාකම රු. 287,044ක් අඩුවෙන් තොග පොතට ඇතුළත් කර තිබීම හා ප්‍රයෝජනයට ගත නොහැකි රු. 871,055ක තොග අවසන් තොගයට ඇතුළත් කර තිබීම හේතුවෙන් තොග පොත් අනුව අවසන් තොග ශේෂයේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කාර්තු වාර්තා අනුව දිස්ත්‍රික් කාර්යාලවලට රු. 40,607,082 ක තොග නිකුත් කිරීමට අදාළ ණය ඉන්වොයිසිපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 763 | නිලධාරීන්ට මහ පෙන්වීම හා නාස්තිය අවම කිරීම මඟින් තොග පාලනය කාර්යක්ෂම කිරීම සඳහා ගබඩා ව්‍යවස්ථාවක් සම්පාදනය කර නොතිබුණි. |
| **(ආ)** | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය | එකතු කළ අගය මත බදු ආවරණය සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වැනි දිනට වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ වැට් බදු රු. 5,788,958 ක වටිනාකම සම්බන්ධයෙන් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ)** | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| | (i) 3.3 (ආ) ඡේදය | අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, අරමුදල පවත්වා ගෙන යාමේ රෙගුලාසි හඳුන්වාදීමට හා කළමනාකරණ මණ්ඩලයක් පත් කිරීමට කටයුතු නොකර බැංකු කළමනාකරණ මණ්ඩලය යටතේ අරමුදල පවත්වා ගෙන යමින් තිබුණි. |
| | (ii) 4.4 (අ) ඡේදය | අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී මාස 05 ක් තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවද, 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2.4 ලැබිය යුතු ගිණුම්

ලංකා සළුසල ආයතනයට අයත් ගබඩාවේ ගබඩා කර තිබූ ලිපිද්‍රව්‍ය තොග 2010 වර්ෂයේදී ඉවත් කර ගෙන තිබූ නමුත්, එම ගබඩාවට ගෙවා තිබූ කුලී තැන්පතුව රු. 1,454,112 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 6,865,974 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 4,285,574 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,580,400 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට අරමුදලේ ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 04 ක ප්‍රමාදයකින් පසුව විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

--------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර ගිණුම් පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.